ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk


# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2020 පෙබරවාරි මස 17 දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2019 දෙසැම්බර්

### සමස්ත නිරීක්ෂණ

2019 දෙසැම්බර් මාසයේදී අපනයන ආදායම අඩු වූ අතර, ආනයන වියදම වැඩි වීමෙන් වෙළඳ හිඟය පුළුල් විය. 2019 වසර තුළදී ආනයන වියදම සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වීම හේතුවෙන් වෙළඳ හිඟය සැලකිය යුතු ලෙස අඩු විය. වසර තුළදී සමුච්චිත පදනම මත සංචාරක ඉපැයීම් අඩු වුවද, 2019 දෙසැම්බර් මාසයේදී සංචාරක කර්මාන්තය නැවත යථා තත්ත්වයට පත්වීම වේගවත් විය. 2019 දෙසැම්බර් මස විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වීම, 2019 වසර තුළදී සමුච්චිත පදනම මත එහි අඩු වීම සුළු වශයෙන් පහළ යෑමට උපකාරී විය. මේ අතර, 2019 දෙසැම්බර් මාසයේදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් සැලකිය යුතු ලෙස විදේශීය ආයෝජන ගෙවීමක් වාර්තා වූ අතර කොළඹ කොටස් වෙළඳපොළ තුළින්ද සුළු ශුද්ධ ගෙවීම් දක්නට ලැබුණි. 2019 වසරේදී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව අතිප්‍රමාණය වූ අතර 2020 වසරේ මේ දක්වා කාලපරිච්ඡේදය තුළදී ස්ථාවරව පැවතුණි.




ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක. සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව https://www.cbsl.gov.lk/si/node/6181

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2018 දෙසැ. එ.ජ.ඩො. මිලියන | 2019 දෙසැ. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2018 ජන.- දෙසැ. එ.ජ.ඩො. මිලියන | 2019 ජන.- දෙසැ. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 1,033 | 1,000 | -3.2 | 11,890 | 11,940 | 0.4 |
| ආනයන | 1,735 | 1,784 | 2.9 | 22,233 | 19,937 | -10.3 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -701 | -784 | | -10,343 | -7,997 | |
| සංචාරක ඉපැයීම් | 475 (ආ) | 454 (ඇ) | -4.5 | 4,381(ආ) | 3,592 (ඇ) | -18.0 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 584 | 665 | 13.8 | 7,015 | 6,717 | -4.3 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -26 | -5 | | -55 | -35 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 44 | 109 | | 5,534 | 6,561 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 8 | 17 | | 706 | 596 | |
| දිගුකාලීන ණය | 36 | 92 | | 2,328 | 1,565 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | | 2,500 | 4,400 | |
| ජා.මූ. අරමුදල - විස්තීර්ණ ණය පහසුකම | - | - | | 252 | 328 | |
| විදේශ සෘජු ආයෝජන (ඉ) | | | | 1,652 | 772 | |
| සමස්ත ශේෂය | | | | -1,103 | 377 | |


මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2018 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.
(ඉ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස නවය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළෙඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ.

## වෙළඳ හිඟය හා වෙළඳ මිල අනුපාතය


- 2019 වසරේ දෙසැම්බර් මාසයේදී **වෙළඳ ගිණුමේ හිඟය** 2018 වසරේ දෙසැම්බර් මාසයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 701 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 784 ක් දක්වා පුළුල් වූ අතර, මේ සඳහා පෙර වසරට සාපේක්ෂව අපනයන අඩුවීම සහ ආනයන ඉහළ යෑම හේතු විය. කෙසේ වුවද, සමුච්චිත වශයෙන් සැලකූ විට, 2019 වසර තුළදී වෙළඳ හිඟය 2018 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 10,343 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 7,997 ක් දක්වා එ.ජ. ඩොලර් මිලියන 2,346 කින් අඩු විය. වෙළඳ හිඟය අඩු වීම සඳහා ප්‍රධාන වශයෙන් දායක වූ අයිතම රූපසටහන 1 මගින් දැක්වේ.
- මේ අතර, අපනයන මිල ගණන්වලට සාපේක්ෂව ආනයන මිල ගණන්හි අනුපාතය දැක්වෙන **වෙළඳ මිල අනුපාතය** 2019 වසරේ දෙසැම්බර් මාසයේදී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 2.9 කින් පහළ ගිය අතර, ඒ සඳහා ආනයන මිල ගණන් පහළ යෑමේ වේගයට වඩා වැඩි වේගයකින් අපනයන මිල ගණන් පහළ යෑම හේතු විය. සමුච්චිත වශයෙන් සැලකූ විට, 2019 වසර තුළදී වෙළඳ මිල අනුපාතය 2018 වසරට සාපේක්ෂව සියයට 1.5 කින් පහත වැටුණි.

**රූප සටහන 1: වෙළඳ හිඟය අඩු වීම සඳහා දායක වූ ප්‍රධාන අයිතම : 2019 ජනවාරි - දෙසැම්බර් (එ.ජ. ඩොලර් මිලියන)**





මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2018 – 2019)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2018 – 2019)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

- 2019 වසරේ දෙසැම්බර් මාසයේදී **වෙළඳ භාණ්ඩ අපනයන** ක්‍රියාකාරිත්වය 2018 වසරේ දෙසැම්බර් මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,000 ක් දක්වා සියයට 3.2 කින් පහත වැටුණු අතර, මේ සඳහා කෘෂිකාර්මික අපනයන මෙන්ම කාර්මික අපනයන අඩුවීම ද හේතු විය.
- බොහෝ උප කාණ්ඩවල අපනයන අඩුවීම හේතුවෙන් 2019 වසරේ දෙසැම්බර් මාසයේදී **කෘෂිකාර්මික අපනයන** ආදායම පහත වැටුණි. තේ අපනයන පරිමාව හා මිල ගණන් යන දෙකම පහත වැටීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව තේ අපනයන ආදායම පහත වැටුණි. කුළුබඩු අපනයන ආදායම පහත වැටුණු අතර මේ

සඳහා සියලුම උප කාණ්ඩවල අපනයන මිල ගණන් පහත වැටීමත් කරාබුනැටි හැර අනෙකුත් උප කාණ්ඩවල අපනයන පරිමාව අඩු වීමත් හේතු විය. ඇමෙරිකා එක්සත් ජනපදය වෙතින් වූ ඉල්ලුම පහත වැටීම සමඟ මුහුදු ආහාර අපනයන ආදායම ද පහත වැටුණි. මෙයට වෙනස්ව යමින්, මෙම මාසය තුළදී ප්‍රධාන වශයෙන් පුවක් සහ පලතුරු ඇතුළු සුළු කෘෂිකාර්මික නිෂ්පාදන අපනයන ආදායම ඉහළ ගියේය.


- 2019 දෙසැම්බර් මාසයේදී **කාර්මික අපනයන** ආදායම 2018 දෙසැම්බර් මාසයට සාපේක්ෂව පහත වැටුණු අතර, කැනඩාව, ඕස්ට්‍රේලියාව සහ චීනය වැනි සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙතින් වූ ඉල්ලුම ඉහළ ගියද යුරෝපා වෙළඳපොළ සහ ඇමෙරිකා එක්සත් ජනපදය වෙතින් වූ ඉල්ලුම පහත වැටීම හේතුවෙන් 2019 දෙසැම්බර් මාසයේදී රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම පහත වැටීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. පරිවර්තණය කරන ලද කම්බි, රැහැන් හා සන්නායක හැර අනෙකුත් බොහෝ උප කාණ්ඩවල අපනයන පහත වැටීම හේතුවෙන් යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම පහත වැටුණි. ශල්‍ය හා වෙනත් අත්වැසුම් අපනයනය ඉහළ ගියද, ටයර් අපනයනය පහත වැටීම හේතුවෙන් රබර් නිෂ්පාදිත අපනයන ආදායම ද පහත වැටුණි. මෙයට වෙනස්ව යමින්, නැව් සඳහා යොදාගනු ලබන ඉන්ධන අපනයනය පහත වැටුණද, ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් ආශ්‍රිත වායු අපනයනය ඉහළ යෑම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය. මීට අමතරව, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම ද ඉහළ ගියේය.
- 2019 දෙසැම්බර් මාසයේදී ලෝපස්, ලෝබොර හා අලු අපනයනය ඉහළ යෑම හේතුවෙන් පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව **ඛනිජ අපනයන** ආදායම කැපී පෙනෙන ලෙස වර්ධනය විය.
- 2019 දෙසැම්බර් මාසයේදී අපනයන පරිමා දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 1.8 කින් ඉහළ ගිය අතර, අපනයන මිල දර්ශකය සියයට 4.9 කින් පහත වැටුණි. මේ අනුව, 2018 දෙසැම්බර් මාසයට සාපේක්ෂව මෙම මාසයේදී අපනයන ආදායම පහත වැටීම සඳහා මිල ගණන් පහත වැටීම මුළුමනින්ම හේතු වූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




මූලය: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: අපනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2018 දෙසැ. (එ.ජ. ඩොලර් මිලියන) | 2019 දෙසැ. (එ.ජ. ඩොලර් මිලියන ) | වෙනස (%) | 2018 ජන.- දෙසැ. (එ.ජ. ඩොලර් මිලියන) | 2019 ජන.- දෙසැ.. (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **813.2** | **798.9** | **(1.8)** | **9,258.2** | **9,426.3** | **1.8** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 38.5 | 36.1 | (6.2) | 462.3 | 447.0 | (3.3) |
| සත්ත්ව ආහාර | 8.2 | 11.6 | 41.9 | 107.8 | 129.0 | 19.7 |
| රෙදිපිළි හා ඇඟලුම් | 493.4 | 483.2 | (2.1) | 5,317.7 | 5,596.5 | 5.2 |
| එයින් ඇඟලුම් | 459.6 | 451.9 | (1.7) | 4,960.8 | 5,205.5 | 4.9 |
| රෙදිපිළි | 24.2 | 22.8 | (5.8) | 260.1 | 284.3 | 9.3 |
| වෙනත් රෙදිපිළි සැකසුම් | 9.6 | 8.6 | (11.1) | 96.8 | 106.7 | 10.2 |
| රබර් නිෂ්පාදිත | 76.4 | 73.0 | (4.4) | 875.3 | 866.1 | (1.1) |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 18.9 | 24.3 | 28.8 | 278.0 | 305.7 | 10.0 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 33.1 | 29.7 | (10.5) | 434.8 | 400.0 | (8.0) |
| ප්‍රවාහන උපකරණ | 8.4 | 6.2 | (26.5) | 120.3 | 145.9 | 21.3 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 52.9 | 55.3 | 4.5 | 622.1 | 521.1 | (16.2) |
| රසායනික නිෂ්පාදිත | 13.2 | 12.8 | (3.0) | 166.8 | 176.3 | 5.7 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 11.7 | 9.3 | (20.7) | 140.5 | 129.4 | (7.9) |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.4 | 3.7 | 56.4 | 31.7 | 48.3 | 52.4 |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 8.7 | 7.5 | (14.1) | 147.7 | 102.9 | (30.3) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 7.4 | 5.8 | (21.9) | 77.6 | 73.5 | (5.4) |
| මූල ලෝහ හා උපාංග | 12.4 | 13.4 | 8.6 | 165.4 | 176.5 | 6.7 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 2.0 | 2.3 | 19.4 | 31.3 | 30.1 | (3.9) |
| වෙනත් | 25.7 | 24.6 | (4.0) | 279.0 | 278.1 | (0.3) |
| **2. කෘෂිකාර්මික අපනයන** | **216.6** | **195.4** | **(9.8)** | **2,579.3** | **2,461.9** | **(4.6)** |
| තේ | 117.1 | 105.8 | (9.6) | 1,428.5 | 1,346.4 | (5.7) |
| රබර් | 1.9 | 1.8 | (4.8) | 31.6 | 24.2 | (23.4) |
| පොල් | 23.9 | 21.8 | (8.5) | 311.0 | 329.5 | 6.0 |
| කුළුබඩු | 30.0 | 21.1 | (29.6) | 360.2 | 312.5 | (13.2) |
| එළවළු | 2.2 | 2.8 | 27.7 | 28.2 | 32.0 | 13.3 |
| සකස් නොකළ දුම්කොළ | 4.1 | 3.6 | (10.6) | 35.6 | 34.7 | (2.4) |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 8.3 | 14.6 | 75.5 | 118.4 | 120.0 | 1.4 |
| මුහුදු ආහාර | 29.2 | 23.9 | (18.3) | 265.8 | 262.5 | (1.3) |
| **3. ඛනිජ අපනයන** | **2.0** | **3.3** | **67.7** | **34.4** | **33.9** | **(1.4)** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.6** | **2.4** | **45.5** | **17.8** | **17.9** | **0.6** |
| **මුළු අපනයන** | **1,033.4** | **999.9** | **(3.2)** | **11,889.6** | **11,940.0** | **0.4** |


(අ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය


- 2019 වසරේ දෙසැම්බර් මාසයේදී **වෙළඳ භාණ්ඩ ආනයන** වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,784 ක් දක්වා සියයට 2.9 කින් ඉහළ ගිය අතර, එය 2018 වසරේ ඔක්තෝබර් මාසයට පසුව ප්‍රථම වරට වාර්තා වූ ඉහළ යෑමයි. මේ සඳහා ආයෝජන භාණ්ඩ සහ පාරිභෝගික භාණ්ඩ ආනයනය ඉහළ යෑම හේතු විය.
- ආහාරමය පාරිභෝගික භාණ්ඩ සහ ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ යන දෙඅංශයේම ආනයන ඉහළ යෑම හේතුවෙන් 2019 වසරේ දෙසැම්බර් මාසයේදී **පාරිභෝගික භාණ්ඩ** ආනයන වියදම ඉහළ ගියේය. මේ අනුව, ආහාර හා පාන වර්ග යටතේ වර්ග කර ඇති එළවළු (ප්‍රධාන වශයෙන් ලොකු ළූණු), කුළුබඩු (ප්‍රධාන වශයෙන් මිරිස්) සහ පාන වර්ග (ප්‍රධාන වශයෙන් මද්‍යසාර අඩංගු පාන වර්ග) ආනයනය ඉහළ ගියේය. මේ අතර, මෙම මාසයේදී ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ යටතේ වර්ග කර ඇති බොහෝ කාණ්ඩවල ආනයන ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් සහනදායී බලපත්‍ර යටතේ රථවාහන ආනයනය කිරීමේ බලපෑම පිළිබිඹු කරමින් ලක්ෂ්‍යමය පදනම මත සැලකීමේදී 2018 වසරේ නොවැම්බර් මාසයට පසුව ප්‍රථම වරට පෞද්ගලික රථවාහන ආනයන වියදම ඉහළ ගියේය.
- යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ප්‍රවාහන උපකරණ ආනයනය ඉහළ යෑම හේතුවෙන් 2019 වසරේ දෙසැම්බර් මාසයේදී **ආයෝජන භාණ්ඩ** ආනයන වියදම ඉහළ ගියේය. වෛද්‍ය හා රසායනාගාර උපකරණ ආනයන ඉහළ යෑම හේතුවෙන් යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම ඉහළ ගිය අතර, දුම්රිය ආශ්‍රිත උපකරණ සහ වාණිජ කටයුතු සඳහා යොදා ගනු ලබන රථවාහන ආනයනය ඉහළ යෑම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වුවද, යකඩ හා වානේ ආශ්‍රිත උපාංග, ඛනිජ නිෂ්පාදිත සහ පරිවරණය කරන ලද කම්බි හා රැහැන් හැර අනෙකුත් බොහෝ උප කාණ්ඩවල ආනයනය පහත වැටීම හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම පහත වැටුණි.
- ප්‍රධාන වශයෙන් යකඩ හා වානේ වැනි මූල ලෝහ ආනයන වියදම පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙස 2019 වසරේ දෙසැම්බර් මාසයේදී **අන්තර් භාණ්ඩ** ආනයන වියදම පහත වැටුණි. ආනයන පරිමාව මෙන්ම මිල ගණන්ද පහත වැටීම හේතුවෙන් පොහොර සහ තිරිඟු හා ඉරිඟු ආනයන වියදම පහත වැටුණි. කෙසේ වුවද, ආනයන පරිමාව පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙස බොරතෙල් සහ ගල් අඟුරු ආනයන වියදම පහත වැටුණද ප්‍රධාන වශයෙන් සාමාන්‍ය ආනයන මිල ගණන් හා ආනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන වියදම ඉහළ යෑම නිසා මෙම මාසයේදී ඉන්ධන ආනයන වියදම ඉහළ ගියේය. රෙදි වර්ග හා කෙඳි වර්ග ආනයනය ඉහළ යෑම හේතුවෙන් රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයනය වියදම ඉහළ ගියේය.
- 2019 දෙසැම්බර් මාසයේදී ආනයන පරිමා දර්ශකය සියයට 5.0 කින් ඉහළ ගිය අතර ආනයන මිල දර්ශකය 2.1 කින් පහත වැටුණි. මේ අනුව 2018 වසරේ දෙසැම්බර් මාසයට සාපේක්ෂව මෙම මාසයේදී ආනයන ඉහළ යෑම සඳහා ආනයන පරිමා දර්ශකය ඉහළ යෑම මුළුමනින්ම හේතු වූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 6: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: ආනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)**

| කාණ්ඩය | 2018 දෙසැ. (එ.ජ. ඩොලර් මිලියන) | 2019 දෙසැ. (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) | 2018 ජන.- දෙසැ. (එ.ජ. ඩොලර් මිලියන) | 2019 ජන.- දෙසැ. (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **357.0** | **390.9** | **9.5** | **4,979.7** | **3,956.5** | **(20.5)** |
| ආහාර හා පාන වර්ග | 134.6 | 148.0 | 10.0 | 1,606.1 | 1,426.9 | (11.2) |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 4.9 | 4.0 | (19.2) | 126.2 | 36.1 | (71.4) |
| එයින් සහල් | 2.9 | 1.8 | (36.3) | 106.8 | 12.8 | (88.0) |
| කිරි නිෂ්පාදිත | 33.2 | 29.9 | (10.1) | 332.3 | 311.9 | (6.1) |
| එළවළු | 26.1 | 40.5 | 55.3 | 304.0 | 310.0 | 2.0 |
| මුහුදු ආහාර | 14.8 | 15.3 | 3.3 | 197.2 | 214.6 | 8.8 |
| සීනි හා රසකැවිලි | 26.3 | 21.3 | (19.0) | 249.7 | 201.2 | (19.4) |
| කුළුබඩු | 9.8 | 13.3 | 34.8 | 114.0 | 115.4 | 1.3 |
| පාන වර්ග | 6.2 | 8.3 | 34.6 | 87.2 | 83.3 | (4.5) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 13.3 | 15.5 | 16.9 | 195.5 | 154.4 | (21.0) |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 222.4 | 242.8 | 9.2 | 3,373.6 | 2,529.6 | (25.0) |
| පෞද්ගලික රථවාහන | 77.3 | 83.9 | 8.6 | 1,573.5 | 815.7 | (48.2) |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 43.4 | 54.7 | 26.0 | 532.0 | 552.6 | 3.9 |
| රෙදිපිළි හා උපාංග | 26.9 | 24.0 | (10.7) | 310.3 | 275.1 | (11.3) |
| ගෘහ උපකරණ | 16.2 | 19.2 | 18.5 | 232.2 | 206.6 | (11.0) |
| විදුලි සංදේශ මෙවලම් | 21.5 | 21.6 | 0.5 | 272.4 | 247.2 | (9.3) |
| ගෘහ හා දැව භාණ්ඩ | 13.0 | 16.7 | 28.3 | 169.4 | 171.9 | 1.5 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 24.1 | 22.7 | (5.8) | 283.8 | 260.5 | (8.2) |
| **2. අන්තර් භාණ්ඩ** | **983.1** | **956.4** | **(2.7)** | **12,488.0** | **11,369.6** | **(9.0)** |
| ඉන්ධන | 317.3 | 333.2 | 5.0 | 4,151.9 | 3,891.6 | (6.3) |
| එයින් බොරතෙල් | 91.4 | 50.2 | (45.0) | 978.1 | 970.7 | (0.8) |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 187.0 | 259.0 | 38.5 | 2,937.2 | 2,706.4 | (7.9) |
| ගල් අඟුරු | 39.0 | 24.0 | (38.4) | 236.6 | 214.6 | (9.3) |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 20.0 | 23.9 | 19.6 | 572.7 | 201.4 | (64.8) |
| එයින් රත්‍රන් | ... | 0.1 | 4,217.7 | 438.7 | 2.6 | (99.4) |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 241.5 | 248.3 | 2.8 | 2,858.5 | 2,909.4 | 1.8 |
| රසායනික නිෂ්පාදිත | 69.9 | 67.1 | (4.1) | 904.2 | 831.5 | (8.0) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 51.5 | 54.2 | 5.3 | 697.4 | 612.9 | (12.1) |
| කඩදාසි හා ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 42.7 | 37.6 | (11.9) | 529.4 | 457.3 | (13.6) |
| මූල ලෝහ | 86.1 | 50.7 | (41.1) | 682.8 | 562.8 | (17.6) |
| පොහොර | 26.0 | 17.4 | (33.2) | 261.6 | 221.4 | (15.4) |
| තිරිඟු හා ඉරිඟු | 24.9 | 20.1 | (19.4) | 373.5 | 346.4 | (7.3) |
| ආහාර සැකසුම් | 21.7 | 16.8 | (22.8) | 296.8 | 227.7 | (23.3) |
| කෘෂිකාර්මික යෙදවුම් | 17.9 | 19.3 | 8.1 | 207.6 | 187.9 | (9.5) |
| ඛනිජ නිෂ්පාදිත | 10.4 | 12.2 | 17.2 | 181.4 | 243.3 | 34.1 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 53.3 | 55.7 | 4.6 | 770.1 | 676.1 | (12.2) |
| **3. ආයෝජන භාණ්ඩ** | **394.0** | **435.5** | **10.5** | **4,690.4** | **4,602.6** | **(1.9)** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 200.0 | 238.5 | 19.3 | 2,491.6 | 2,489.7 | (0.1) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 141.3 | 117.0 | (17.2) | 1,524.5 | 1,508.7 | (1.0) |
| ප්‍රවාහන උපකරණ | 52.2 | 78.2 | 49.8 | 668.1 | 596.6 | (10.7) |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.4 | 1.7 | 306.8 | 6.1 | 7.6 | 25.5 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.4** | **1.4** | **224.9** | **74.6** | **8.3** | **(88.9)** |
| **මුළු ආනයන** | **1,734.6** | **1,784.2** | **2.9** | **22,232.7** | **19,937.1** | **(10.3)** |

(අ) තාවකාලික


මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

... සැලකිය යුතු නොවේ.

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්


- පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරවලින් පසුව බලපෑමට ලක් වූ **සංචාරක පැමිණීම්** සැලකිය යුතු ලෙස යථා තත්ත්වයට පත් වූ අතර, පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව 2019 වසරේ දෙසැම්බර් මාසයේදී එහි සුළු අඩු වීමක් පමණක් වාර්තා විය. මෙම මාසය තුළදී සංචාරකයින් 241,663 ක් මෙරටට පැමිණ ඇති අතර, එය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව 2019 වසරේ නොවැම්බර් මාසයේදී වාර්තා වූ සියයට 9.5 ක අඩු වීම සහ ඔක්තෝබර් මාසයේදී වාර්තා වූ සියයට 22.5 ක අඩු වීම හා සසඳන විට සියයට 4.5 ක අඩු වීමකි. 2019 දෙසැම්බර් මාසයේදී, පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව රුසියාව, කැනඩාව සහ එක්සත් ජනපදය වැනි රටවල්වලින් පැමිණි සංචාරකයින් ගණන ඉහළ ගිය අතර ප්‍රංශය, ජර්මනිය, මාලදිවයින සහ එක්සත් රාජධානිය වැනි ප්‍රධාන රටවල්වලින් පැමිණි සංචාරකයින් ගණන අඩු විය. 2019 වසරේදී සංචාරක පැමිණීම් මිලියන 1.9 ක් වාර්තා වූ අතර එය 2018 වසරේ වාර්තා වූ මිලියන 2.3 ට සාපේක්ෂව සියයට 18.0 ක අඩු වීමකි. චීනයෙන් ආරම්භ වී තවත් රටවල් කිහිපයකට ව්‍යාප්ත වූ නව කොරෝනා වෛරසය හේතුවෙන් ඉදිරි කාලය තුළදී සංචාරක අංශය තවදුරටත් පසුබෑමකට ලක් විය හැකිය.
- 2019 වසරේ දෙසැම්බර් මාසයේදී **සංචාරක ඉපැයීම්**, 2018 දෙසැම්බර් මාසයේදී වූ එ.ජ. ඩොලර් මිලියන 475 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 454 ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. 2019 වසරේදී සංචාරක ඉපැයීම්, පෙර වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 4,381 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 3,592 ක් වනු ඇතැයි තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත.
- මේ අතර, 2019 දෙසැම්බර් මාසයේදී, **විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ** එ.ජ. ඩොලර් මිලියන 665 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 13.8 ක වැඩිවීමක් වාර්තා කළේය. සමුච්චිත පදනම මත, 2019 වසරේ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 6,717 ක් වූ අතර එය 2018 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 7,015 ට සාපේක්ෂව සියයට 4.3 ක අඩු වීමකි.

**රූප සටහන 8: සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව


## මූල්‍ය ලැබීම්

- 2019 වසරේ දෙසැම්බර් මාසයේදී රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි වූ විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 100 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කිරීම හේතුවෙන්, සමුච්චිත පදනම මත, 2019 වසර තුළදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 334 ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය.
- 2019 වසරේ දෙසැම්බර් මාසයේදී ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව කොළඹ කොටස් වෙළඳපොළ තුළින් එ.ජ. ඩොලර් මිලියන 5 ක ශුද්ධ විදේශීය ගෙවීමක් වාර්තා විය. සමුච්චිත පදනම මත, 2019 වසරේදී කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 35 ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය.
- තවද, 2019 දෙසැම්බර් මාසයේදී රජය වෙත වූ දිගුකාලීන ණය, ශුද්ධ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 8 ක් විය.

## ජාත්‍යන්තර සංචිත

- 2019 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට දළ නිළ සංචිත එ.ජ. ඩොලර් බිලියන 7.6 ක් වූ අතර, එය ආනයනික මාස 4.6 කට සමාන විය. මේ අතර, දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත මුළු විදේශීය වත්කම් ප්‍රමාණය, 2019 දෙසැම්බර් මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 10.4 ක් වූ අතර, එය ආනයනික මාස 6.3 කට සමාන විය.

**රූප සටහන 10: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

- 2019 වසරේ දෙසැම්බර් මාසය තුළදී ශ්‍රී ලංකා රුපියල ස්ථාවරව පැවති අතර 2019 වසර තුළදී එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 0.6 කින් අතිප්‍රමාණය විය. 2020 වසරේ පෙබරවාරි 17 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී විනිමය අනුපාතිකය තවදුරටත් සියයට 0.1 කින් අතිප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් 2020 පෙබරවාරි 17 දක්වා කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව අතිප්‍රමාණය විය.

**රූප සටහන 11: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2018 | 2019 | 2020 (පෙබ. 17 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -16.4% | +0.6% | +0.1% |
| යුරෝ | -12.7% | +2.6% | +3.5% |
| ස්ටර්ලිං පවුම | -11.4% | -2.8% | +0.7% |
| ජපන් යෙන් | -18.1% | -1.0% | +1.2% |
| කැනේඩියානු ඩොලරය | -9.3% | -3.7% | +1.6% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -7.6% | +1.3% | +4.3% |
| ඉන්දියානු රුපියල | -8.7% | +2.6% | +0.4% |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව